**ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව**
**இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு**
**HUMAN RIGHTS COMMISSION OF SRI LANKA**

මගේ අංකය / எனது இல. / My No.  ඔබේ අංකය / உமது இல. / Your No.  දිනය / திகதி / Date: 2021-02-23

පැමිණිලි පාර්ශවය : වී. සුබ්‍රමනියම් මයා,
60, තෝනිකල් පාර,
කට්කුලි, වවුනියාව.

වගඋත්තර පාර්ශවය : සභාපති,
ශ්‍රී ලංකා මහ බැංකුව
කොළඹ 01.

<u>පැමිණිලි අංකය : HRC/2499/19</u>

පැමිණිල්ලේ කරුණු දැක්වීම :-

ඉහත පැමිණිලි පාර්ශවය විසින් මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ පැමිණිල්ලක් ගොනු කරමින් සඳහන් කර ඇත්තේ, මුදල් නෝට්ටු මුද්‍රණය කිරීමේ වගකීම මහ බැංකුව සතු කාරණයක් වන බවත්, එහිදී දෘශ්‍යාබාධිත පුද්ගලයන් විසින්ද මුදල් ගණුදෙනු කරනු ලැබුවද, ඔවුන්ට එම මුදල් පහසුවෙන් හඳුනා ගැනීමට ක්‍රමවේදයක් හඳුන්වා දී නොමැති වීම විශාල අඩුපාඩුවක් බවත්ය. එමෙන්ම, මේ පිළිබඳව වරින් වර දෘශ්‍යාබාධිත ප්‍රජාව විසින් මහ බැංකුව හා රජයේ වගකිවයුතු ආයතන දැනුවත් කළද, ඉහත කී ගැටළුවට විසඳුම් ලැබී නොමැති බවද, මේ ආකාරයෙන් මෙම ගැටළුවට විසඳුම් ලබා නොදීම ඔවුන්ට සිදු කරනු ලබන වෙනස් කොට සැලකීමක් බවද පැමිණිල්ලෙන් ප්‍රකාශ කර ඇත.

වගඋත්තරකරුවන්ගේ කරුණු දැක්වීම :-

ඉහත පැමිණිල්ලට අදාළව මානව හිමිකම් කොමිෂන් සභාව විසින් සිදු කරන ලද විමර්ශනයට අනුව වගඋත්තරකරු වන ශ්‍රී ලංකා මහ බැංකුව වෙනුවෙන් "අධිකාරී, ව්‍යවහාර මුදල්" විසින් 2019.12.04


ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R. A. De Mel Mawatha, Colombo - 04.
සභාපති / தவிசாளர் / Chairperson: 011-2505451
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2505541 / 74
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrcsl@gmail.com
දුරකථන / தொலைபேசி / Telephone: 94 -11- 2505580 / 81 / 82
ලේකම් / செயலாளர் / Secretary: 011-2505521
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 1996
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

දිනැතිව අංක 12/02/010/0009/001 දරණ වාර්තාව මානව හිමිකම් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇත. එමඟින් පහත කරුණු ඉදිරිපත් කර ඇත.

01. වර්තමානයේ සංසරණය වන 11 වන මුදල් නෝට්ටු කාණ්ඩය නිකුත් කිරීමේදී ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ස්පර්ශයෙන් හඳුනාගත හැකි උස්වූ මුද්‍රිත හරහා දෘශ්‍යාබාධිත පුද්ගලයන්ට ව්‍යවහාර මුදල් නෝට්ටුවල වටිනාකම වෙන් වශයෙන් හඳුනා ගැනීමට යම්තාක් දුරට පහසු කර ඇති බවත්,

02. එම උස් වූ මුද්‍රිත නෝට්ටුවේ වම්පස සිරස් අතට රළු තිත් (රු. 20 නෝට්ටුවේ එක් තිතක්) නෝට්ටුවේ වටිනාකම වැඩිවෙමින් යන ආකාරයට මුද්‍රණය කර ඇති බවත්,

03. නෝට්ටුවේ මුහුණත හඳුනා ගැනීම සඳහා නෝට්ටුවේ දෙපස දාරයන්හි උස්ව මුද්‍රිත ඉරි යොදා ඇති බවත්,

04. උස් වූ මුද්‍රිත නෝට්ටු භාවිතයත් සමඟ ගෙවීයාමේ ස්භාවයක් පවතින බවත්, එය අනෙකුත් රටවල බැංකුවලටද ඇති ගැටළුවක් බවත් ප්‍රකාශ කර ඇත.

05. මෙ සම්බන්ධයෙන් අනෙකුත් රටවල මහබැංකු සහ නෝට්ටු මුද්‍රණ සමාගම්වල සොයා ගැනීම් පිළිබඳ ශ්‍රී ලංකා මහ බැංකුව නිරන්තර අවධානයෙන් සිටින බවත්, ඉදිරියේදී වඩාත් පහසුවෙන් මුදල් නෝට්ටු දෘශ්‍යාබාධිත අයට හඳුනා ගැනීමේ ක්‍රමවේදයක් හඳුන්වා දීමට බලාපොරොත්තු වන බවත් ප්‍රකාශ කර ඇත.

2020.02.06 දින පාර්ශවයන් කැඳවා සිදු කරන ලද පරීක්ෂණයේදී, වගඋත්තරකරු වෙනුවෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේ ව්‍යවහාර මුදල් අධිකාරී එම්. පී. ටී. විජේසූරිය මිය, සහකාර අධ්‍යක්ෂ (නීති) සජිනි ලියනගේ මිය, සහකාර අධිකාරී පී. ඒ. සුදේශිකා මිය පෙනී සිට කරුණු ඉදිරිපත් කර ඇත. එහිදී දැනට මුදල් නෝට්ටු හඳුනා ගැනීමට ඇති ක්‍රමවේදය පිළිබඳ සාකච්ඡා කර ඇති අතර, එය ඉහත ලිඛිත වාර්තාවෙ සඳහන් ආකාරයට බව පැහැදිලි කර ඇත. එමෙන්ම, මෙම ක්‍රමවේදය තුළ පවතින දුර්වලතා පැමිණිලි පාර්ශවය විසින් පෙන්වා දී ඇති අතර, එම දුර්වලතාවන් නිවැරදි කර වඩාත් පහසුවෙන් දෘශ්‍යාබාධිත ප්‍රජාවට මුදල් නෝට්ටු හඳුනාගෙන පරිහරණය කිරීමට හැකිවන පරිදි මුදල් නෝට්ටු මුද්‍රණය වියයුතුව ඇති බව වගඋත්තරකාර පාර්ශවය පිළිගෙන ඇත.

නිරීක්ෂණ :-

මුදල් නෝට්ටු දෘශ්‍යාබාධිත අයට හඳුනා ගැනීමට බෙල් ක්‍රමයෙන් මුදල් නෝට්ටුවල හෝ කාසිවල වටිනාකම යොදා නොමැති බවත්, නෝට්ටු හඳුනා ගැනීම සඳහා ඉහලට නෙරා ඇති පරිදි ස්පර්ශයෙන් හඳුනාගත හැකි තිත් යොදා ඇති බවත් වගඋත්තර පාර්ශවයේ කරුණු දැක්වීම අනුව නිරීක්ෂණය වේ.

මෙම තිත් මුදල් නෝට්ටු පැරණි වීමෙන් ස්පර්ශයෙන් හඳුනා ගැනීමට ගැටළුවක් පවතින බව වගඋත්තරකාර පාර්ශවයද පිළිගෙන ඇති අතර, පැමිණිලි පාර්ශවය පෙන්වා දෙන ලද්දේ මෙම තිත් අලුත් මුදල් නෝට්ටුවලද ස්පර්ශයෙන් හඳුනා ගැනීමේ අපහසුතාවය පවතින බවයි.

මෙම හේතුව නිසා දෘශ්‍යාබාධිතයන් මුදල් ගණුදෙනු කිරීමේදී තවත් පාර්ශවයකින් සහාය පැතීමට සිදුවන බවත්, බොහෝ අවස්ථාවල මුදල් ගණුදෙනුව සිදු කරන අනෙක් පුද්ගලයාගෙන් විමසා මුදල් නෝට්ටු හඳුනා ගැනීමට කටයුතු කිරීමෙන් වංචනික ක්‍රියාවන්ට මුහුණපෑමට සිදුවන බවත් පැමිණිලි පාර්ශවය ඉදිරිපත් කරන කරුණු අනුව නිරීක්ෂණය වේ.

පවතින තත්ත්වය යටතේ මුදල් නෝට්ටු දෘශ්‍යාබාධිතයන්ට හඳුනා ගැනීම අපහසුතාවන් ඇති බව වගඋත්තරකාර පාර්ශවය පිළිගෙන ඇති අතර, මුදල් නෝට්ටු දෘශ්‍යාබාධිතයන්ට හඳුනා ගැනීමට හැකි වන පරිදි නව ක්‍රමයක් හඳුන්වාදීමේ අවශ්‍යතාවයක් ඇති බව පිළිගෙන ඇත.

ඒ අනුව, ඊළඟ මුදල් නෝට්ටු කාණ්ඩය 2021 වසරේ මුද්‍රණය කිරීමට නියමිත බැවින්, එම අවස්ථාවේ මෙම මුදල් නෝට්ටු දෘශ්‍යාබාධිතයන්ට හඳුනා ගැනීමට නව ක්‍රමයක් හඳුන්වාදීමට අවධානය යොමු කිරීමට හැකියාවක් ඇති බව වගඋත්තරකරුවන් ප්‍රකාශ කර ඇත.

පැරණි ක්‍රමයට එක් එක් මුදල් නෝට්ටුවේ ප්‍රමාණය වෙනස් කිරීමෙන් හා කාසිවල පැරණි මුදල් කාසි මෙන් හැඩය වෙනස් කිරීම හඳුනා ගැනීම පහසු වන බව පැමිණිලි පාර්ශවය පැහැදිලි කරන ලද අතර, මුදල් නෝට්ටුවල පළල එකම මට්ටමක තබා ගෙන දිගෙහි පමණක් වෙනසක් ඇති කිරීමට හැකියාව ඇති බවත්, සියලුම කාසිවල හැඩය රවුම් හැඩයක් පවත්වා ගැනීමට අනෙකුත් රටවල්වල අකාරයෙන් කටයුතු කළයුතු බවත්, කාසිද පහසුවෙන් හඳුනා ගැනීමට කාසිවල ප්‍රමාණය වෙනස් කිරීම හා දාර සහිතවීම හා දාර රහිත වීම භාවිතා වන බවත් ප්‍රකාශ විය.

පූර්ණ දෘශ්‍යාබාධිත නොවන පෙනීමේ දුර්වලතා ඇති (low vision) අයට පහසුවෙන් හඳුනා ගත හැකි වන පරිදි මුදල් නෝට්ටුවේ එක් ස්ථානයක හෝ වටිනාකම ඉලක්කමෙන් ලොකුවට සටහන් කිරීම වඩාත්

සුදුසු බව පැමිණිලි පාර්ශවය පෙන්වා දෙන ලදී. මුදල් නෝට්ටුවලට නිල් පැහැය යෙදීමෙන් වඩාත් පැහැදිළිව හඳුනා ගැනීමේ හැකියාවක් පවතින බව පැමිණිලි පාර්ශවය දන්වා ඇත.

දෘශ්‍යාබාධිත අය සඳහා මුදල් නෝට්ටු හා කාසි කුමන ආකාරයෙන් වෙනස් කළ යුතුද යන්න පිළිබඳව ඒ පිළිබඳව උනන්දුවක් දක්වන පාර්ශවයන්ගෙන් කරුණු විමසීමට හා පර්යේෂණයක් සිදු කිරීම වඩාත් සුදුසු බවට පාර්ශවයන් අතර සාකච්ඡා වී ඇත.

නෛතික තත්ත්වය :-

1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 18 වන වගන්තිය අනුව මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වීමක් හෝ උල්ලංඝනය වීමට ආසන්න අවස්ථාවකදී විමර්ශනය හෝ විභාග කිරීමේ බලය කොමිෂන් සභාවට පැවරී ඇත.

උක්ත පැමිණිල්ලට අදාළ කාරණය අනුව දෘශ්‍යාබාධිත ප්‍රජාවට බැංකු කටයුතුවලදී කිසිදු ආකාරයකින් වෙනස් කොට සැලකීමකින් තොරව, එම කටයුතු සිදු කර ගැනීමට 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාව මඟින් රැකවරණය සැලසී ඇත.

එමෙන්ම, 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(4) ව්‍යවස්ථාව අනුව ආබාධිත පුද්ගලයන්ට විශේෂකොට සලකා ඔවුන්ගේ තත්ත්වය නඟා සිටුවීමට කටයුතු කිරීමටද හැකි වන පරිදි නීතිමය රැකවරණය සැලසී ඇත.

නිර්දේශය :-

ඉහත නෛතික තත්ත්වය සලකා බැලීමේදී පුද්ගලයෙකු දෘශ්‍යාබාධිත වීම තුළ ඔහුව කිසිදු ආකාරයේ වෙනස් කමකට භාජනය කළ නොහැක. නමුත් මුදල් නෝට්ටු මුද්‍රණය කිරීමේදී දෘශ්‍යාබාධිත ප්‍රජාවටද හඳුනා ගැනීමට හා ගණුදෙනු කිරීමට හැකිවන පරිදි මුද්‍රණය කිරීමට රජය සතු වගකීමකි. දෘශ්‍යාබාධිත ප්‍රජාව ඔවුන්ට ඇති ගැටළු පෙන්වා දීමෙන් පසුව, එය නොසලකා හරින්නේ නම් එය 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12 (1) ව්‍යවස්ථාවට අනුව ඔවුන්ගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමක් වේ.

01. මුදල් නෝට්ටු හා කාසිවල දැනට පවතින තත්වයන්ගේ අඩුපාඩු පවතින බවද පෙනී යන බැවින් ආබාධිත ප්‍රජාවන්ට පහසුවෙන් හඳුනාගත හැකි වන පරිදි මුදල් නෝට්ටුවල ප්‍රමාණය (දිග-පළල), වර්ණය, ස්පර්ශය මඟින් හඳුනාගත හැකි ස්වභාවය (තිත් හා ඉරි) හා වටිනාකම සටහන් කිරීම

පිළිබඳවද දෘෂ්‍යාබාදිත ප්‍රජාවගේ නියෝජනයක් සහිත මණ්ඩලයක් මඟින් තීරණය කිරීමෙන් පසුව ඉදිරි මුදල් නෝට්ටු හා කාසි මුද්‍රණය කිරීමට අවශ්‍ය පියවර ගත යුතු බවට මානව හිමිකම් කොමිෂන් සභාව විසින් නිර්දේශ කරනු ලැබේ.

එසේම මේ සම්බන්ධයෙන් ඔබ විසින් ගනු ලබන පියවර පිළිබඳ වාර්තාවක් 2021.04-06දිනට පෙර කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම ඉහත කී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද කොමිෂන් සභාවට දැනුම් දිය යුතු බවද වැඩිදුරටත් දන්වමු.

අනුසුයා ෂන්මුගනාදන්,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

**Ms. Anusuya Shanmuganathan**
Commissioner
Human Rights Commissioner of Sri Lanka

ම.හේ. නිමල් කරුණාසිරි,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

**Dr. M.H. Nimal Karunasiri**
Commissioner
Human Rights Commission of Sri Lanka

B/